සැ.යු .- 2015.09.11 දින පළ වූ අංක 1932 දරන ගැසට් පත්‍රයේ VI (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,933 - 2015 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 620 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 673 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි** *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

619 – B 080984 —352 (2015/09)
A 1-

# රජයේ නිවේදන

## හඟුරන්කෙත ඓතිහාසික ඇසළ පෙරහැර ප්‍රසිද්ධ කිරීම - 2015

සියළු දෙනාගේ දැනගැනීම පිණිසයි.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ (2) දෙවන වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයන්ට අනුව 2008 අගෝස්තු මස 15 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය මගින් හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී විෂ්ණු දේවාල පෙරහැර ගැසට් කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

එකී නියෝග ප්‍රකාරව 2015 වර්ෂයට අදාළ හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී විෂ්ණු දේවාල ඇසළ පෙරහැර 2015.09.13 වැනි දින සිට 2015.09.28 වැනි දින දක්වා පැවැත්වෙන බව සියළු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

09 - 402

---

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත , 1964 අංක 24 දරන පනත, 1973 අංක 43 දරන පනත, 1978 අජක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. කේ. රත්නසූරිය,
ලේකම් (වැ.බ),
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව.

ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 43537 | ජයසිංහ ආරච්චිලාගේ වර්ජිනියා ඇන් නිලන්ති පෙරේරා මිය, "නොයෙලා", අංක. 22/ඒ, බ/නයිනමඩම, නයිනමඩම | චක්‍රවර්තිගේ ක්‍රිෂාන්ත කමල් ප්‍රනාන්දු මයා, අංක 28, රෝෂන් මාවත, 3 වන කුරණ, මීගමුව. |
| (02) 43547 | පහලගේ සුමනාවතී මිය, අංක 62, දවටගහවත්ත, හල්පිට, පොල්ගස්ඕවිට. | සෝමසිරි ඇල්විටිගල මයා, අංක 63/8, ශ්‍රී දේවානන්ද පාර, තුම්බෝවිල, පිලියන්දල. |
| (03) 43522 | සිංහපුරගේ නිර්මලා සුදර්ෂනි මිය, අංක. 48/2, පල්ලේගම, පැපිලියවල. | මනමාල මුදියන්සේලාගේ නිරෝෂ් මයා, අංක. 212/5, මාකොළ දකුණ, මාකොළ. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (04)<br>43461 | මිහිඳුකුලසූරිය ඇන්ටනි කීර්තිසිරි ප්‍රනාන්දු මයා,<br>අංක, 119,<br>සෙල්බි පාර,<br>කුට්ටිදූව,<br>මීගමුව. | උඩුගම්පොලගේ සුරාජ් ජානක ප්‍රනාන්දු මයා,<br>අංක, 285,<br>සුභාසාධක මාවත,<br>දළුවකොටුව,<br>කොච්චිකඩේ. |
| (05)<br>43633 | ආසිරි නන්දගේ දර්ශන තරංග ජයතිලක මයා<br>"තරංග විලා",<br>සියඹලාවැහැර,<br>ගොකරැල්ල. | මුතුගල උපනන්දගේ ශ්‍යාමලී උපනන්ද මිය,<br>දිග්ගලවත්ත,<br>දිද්දෙනිය. |
| (06)<br>43160 | කමනී ස්වර්ණලතා ලියනගේ මිය,<br>අංක. 115,<br>මහ හීනැටියගල,<br>කළුතර දකුණ,<br>කළුතර. | 1. පලාමුණිගේ දමිත් ධනංජය ද සිල්වා මයා,<br>අංක. 303 බී,<br>මහ හීනැටිගල,<br>කළුතර දකුණ.<br><br>2. හෙට්ටිආරච්චිගේ දොන් චානක සමීර ජයසේකර මයා,<br>කෝසල මාවත,<br>නාගොඩ,<br>කළුතර. |
| (07)<br>43545 | ලියනගේ ප්‍රියවංශ පෙරේරා මයා,<br>අංක. 852,<br>"ප්‍රියා වාස",<br>කටුපිලගොල්ල,<br>දොඩම්ගස්ලන්ද. | දූලා දේවයලාගේ තමරා චාන්දනී කුමාරි මිය,<br>පහළවෙල,<br>දොඩම්ගස්ලන්ද. |
| (08)<br>43576 | මොහම්මදු ජුනයිදු මොහම්මදු අයියුබ් මයා,<br>ගල්උස්ස,<br>මඩිගෙ මිදියාල,<br>බණ්ඩාර කොස්වත්ත. | වීරසිංහ මුදියන්සේලාගේ කරුණාරත්න මයා,<br>ගල්උස්ස,<br>මඩිගෙ මිදියාල,<br>බණ්ඩාර කොස්වත්ත. |
| (09)<br>43554 | මාරසිංහ අච්චිල්ලාගේ ඩිංගිරිබණ්ඩා කපුකොටුව මයා,<br>අංක. ඒ/46,<br>අඹවල,<br>හෙට්ටිමුල්ල. | මාරසිංහ ආරච්චිලාගේ සමන් මාරසිංහ මයා,<br>අටලාහේන,<br>මීනුවන්ගමුව,<br>හෙට්ටිමුල්ල,<br>කෑගල්ල. |
| (10)<br>43582 | පනාවැන්නගේ මිල්ටන් ප්‍රනාන්දු මයා,<br>අංක 227/බී,<br>වල්පිට,<br>බටවල,<br>පාදුක්ක. | දෙනිපිටිය ආරච්චිගේ චාන්දනී මිය,<br>අංක 46/1,<br>"සැනසුම",<br>අතුරුගිරිය. |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### සෙලාන් බැංකුව පීඑල්සී - කල්මුණේ ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.07.28 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0970-33499841-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් මුතතම්බි කන්දයියා පෙරින්පරාජා විසින් සහතික කරන ලද 2013 අගෝස්තු මස 06 දිනැති අංක 1994 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සියල්ලෝම කල්මුනෙයි පදිංචි මොහමඩ් ඊබ්‍රහිම් සියාරෝ/මොහමඩ් අලියාර් රාවියා උම්මා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි හතළිස් නව ලක්ෂ අසූඅටදහස් තුන්සිය හැට හතරයි ශත හැත්තෑ හතක (රු. 1,49,88,364.77) මුදලක්, 2014 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,49,88,364.77 මුදලද, 2015 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට දහ හතර (14%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1994 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයයේ බලයලත් වෙන්දේසිකාර චන්ද්‍රිමා ප්‍රියදර්ශනී ගමගේ මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මහ නගර සභා සීමාව තුළ කල්මුනෙයිකුඩි 02 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි මුරුතඩි වලව් නමැති විශාල ඉඩමක කොටසකට මායිම්, උතුරේ සිට නැගෙනහිර : පැත්තට අඩි විසිඅටක්ද, බස්නාහිර පැත්තට අඩි දහසයක්ද නැගෙනහිර සිට බස්නාහිරට අඩි එකසිය පනස් තුනක්ද. (උතුර, ගිණිකොණ පැත්තට අඩි 28, බටහිර : පැත්තට අඩි 16, නැගෙනහිර සිට බස්නාහිරට : අඩි 153) උතුරින් සහ දකුණින් : එම්. අයි. එම්. කාසිම්ට හිමි ඉඩම්වලින් මායිම් වූද, නැගෙනහිරට : කල්මුනෙයි අක්කරෙයිපත්තු ප්‍රධාන පාර සහ බස්නාහිරට : පොඩියාර්කුලම් සහ වෙන්කළ ඉඩමෙන්ද මායිම් වන එහි තුළ අඩංගු සියලු දේ ද සහිත සම්පූර්ණ ඉඩම වේ. මෙය කල්මුනෙයි ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව කේ 96/36 හි ලියා පදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එස්. නේසරාජා විසින් සාදන ලද 2013.06.13 දිනැති අංක එස්එන්ආර්/2013/1537 දරන මෑතක මිණුම් සැලැස්මක් අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මහ නගර සභා සීමාව තුළ අංක 646 සහ 648 දරන කල්මුනෙයිකුඩි 04 පිහිටි මරුතඩි වලව් නමැති ඉඩම් කොටසකට මායිම්, උතුරට සහ දකුණට : එම්. අයි. එම්. කාසිම් හිමිකම් කියන ඉඩම්ද, නැගෙනහිරට : පාර සහ බස්නාහිරට : පොඩියර්කුලම් ද යන මායිම් තුළ පර්චස් දහතුනයි දශම දෙකයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 13.20) නොහොත් හෙක්ටයාර් 0.0334 ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

09 - 444/1

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කත්තන්කුඩි ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.08.10 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0740-02634242-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. යටිගම්මන විසින් දෙකම සහතික කරන ලද සහ 2012 ජූනි මස 29 දිනැති අංක 166 සහ 2013 දෙසැම්බර් මස 3 දිනැති අංක 240, ප්‍රසිද්ධ නොතාරිස් වී .විනෝබා ඉන්ද්‍රන් විසින් සියල්ලම සහතික කරන ලද 2012 ජනවාරි මස 08 දිනැති අංක 16628, දෙකම 2013 නොවැම්බර් මස 22 දිනැති අංක 17561 සහ 17562 සහ 2013 දෙසැම්බර් මස 16 දිනැති, අංක 17587 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කත්තන්කුඩි හි ලියාපදිංචි අංක ඒ-279 දරන "ඔකස් එන්ටප්‍රයිසර්ස්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කත්තන්කුඩි හි මොහමඩ් සරවුදීන් මොහමඩ් හරූන් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකොලොස් කෝටි තිස්පන් ලක්ෂ හතළිස් හතර දහස් හත්සිය හැත්තෑවයි ශත හතළිස් පහක මුදලක් (රු.11,35,44,770.45) ක මුදලක්, 2015 පෙබරවාරි මස 2 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ

අයවිය යුතුව ඇති හෙයින් ද රු.11,35,44,770.45 මුදලද, 2015 පෙබරවාරි මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී අංක 166, 240, 16628, 17561, 17562 සහ 17587 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවන, දෙවෙනි, තුන්වන, හතරවන සහ පස්වන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවෙනි උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි කරන ලද තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ මැද පත්තුවේ මානික්කම්පට්ටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩබ්ලිව්. එල්. එල්. ගාමිණී විසින් සාදන ලද 2011.03.05 දිනැති අංක පීඕ/2011/3/01 සැලැස්මේ නිරූපනය වන සෙම්බුකඩු යාය ඉඩම නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්. උතුරට : මානික්කම් පට්ටිය පාර (පීඑස්) සහ සෙම්බුකඩු යාය ඉඩම ද, නැගෙනහිරට : ඒ. බී. එම්. මුස්තාපාගේ සෙම්බුකඩු යාය ඉඩම, ඉඩම් අංක පීඕ/2010/10/02 සැලැස්මේ ලොට් 2 සහ ලොට් 02හි කොටසක් සහ අංක 1398 දරන සැලැස්මේ ලොට් 02 සහ 3හි කොටසක් ද, දකුණට : පාර (පීඑස්) සහ බස්නාහිරට : මානික්කම් පට්ටිය පාර (පීඑස්) යන මායිම් තුළ (අ. 06, රූඩ්. 02, පර්. 17.02) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා, වැවිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

### දෙවෙනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මන්මුනෙයි පත්තුවේ වරිපනම් අංක 8 දැන් 8/1 දරන කත්තන්කුඩි නගර සභා සීමාව තුළ කපුරාඩි පාර කොට්ඨාස අංක 1 තුළ කට්ටන්කුඩි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් සාදන ලද 2001.01.17 දිනැති අංක ඒඑස්/2001/736 දරන මිනුම් සැලැස්මේ නිරූපනය වන බෙදා වෙන්කරන ලද ඉඩම් කැබැල්ලෙහි බස්නාහිර පංගුව සහ මෙය නැවත මැන බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් සාදන ලද 2011.10.14 දිනැති අංක ඒ එස්/11/කත්/232 මිනුම් සැලැස්මේ විස්තර කර ඇති අතර එයට මායිම්, නැගෙනහිරට : එම්. අයි.. අබ්දුල් කාදර් සහ බිරිඳගේ ඉඩම, බස්නාහිරට : එම්. එම්. එච්. ඒ. ඊබ්‍රහිම් ගේ ඉඩම ද, උතුරට , මොහමඩ් ඉස්මයිල් හාජියාර්ගේ ඉඩම සහ දකුණට : ඒ. සී. රපික්කාබීබී සහ බිරිඳගේ ඉඩම සහ පටුමග ඉදිරිපස, මෙය ගොඩනැගිල්ල සහ ළිඳ සහ එහි තුළ අඩංගු සියලු හිමිකම් සහිත වේ.පරිමාණය පර්චස් හතරයි දශම නවයයි හතරක් (අ.0, රූ. 0, පර්. 4.94) නොහොත් හෙක්ටයාර 0.0125ක් වේ.

### තුන්වෙනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කත්තන්කුඩි ඩී. එස්. කොට්ඨාසයේ, කත්තන්කුඩි නගර සභා සීමාව තුළ වරිපනම් අංක 93/5 දරන බීච් රෝඩ් දැන් වෝඩ්-3 කත්තන්කුඩි කොට්ඨාසය - 6පී එන් කොට්ඨාසය කත්තන්කුඩි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. නාගලිංගම් විසින් සාදන ලද 2001.04.04 දිනැති අංක එස්එන්/01/4722 සැලැස්මේ සඳහන් වෙම්පුමතිලඩි වලවු සහ නවලඩි වලවු නමැති ඉඩමේ ලොට් 1 සහ ලොට් 24 ලෙස නිරූපනය වන ලොට් දෙකකින් සමන්විත බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස, පරිමාණය නැගෙනහිරට : අඩි 39ක ද, උතුරට : අඩි 120ක් ද, බස්නාහිරට : අඩි 44ක් ද, දකුණට : නිරිත දිග කොනේ සිට නැගෙනහිරට අඩි 55ක් ද, මෙම කෙළවරේ සිට උතුරු පැත්තට අඩි 5ක් ද, මෙම කොනේ සිට නැගෙනහිර කෙළවරට අඩි 65ක් ද වේ. මෙය නැවත මැන බලයලත් මිනින්දෝරු හා තලම්තිකරු ඒ. සිංගරාජා විසින් 2013.07.25 වැනි දින සාදන ලද අංක ඒඑස්/2013/150 සී දරන මිණුම් සැලැස්මේ ලොට් 1 ලෙස නිරූපනය කර සවිස්තරව විස්තර කර ඇති පරිදි නැගෙනහිරට : ඒ. එල්. එම්. ඉෂාක් ගේ උරුමක්කරුවන්ට හිමි වත්ත ද, බස්නාහිරට : මුබිනාට හිමි ඉඩම ද, උතුරට : ඊබ්‍රාලෙබ්බේ සහ තවත් අයට හිමි ඉඩම් සහ දකුණට : එම්. අයි. එම්. මුනීර්ට හිමි අංක එස්එන්/01/4722 සැලැස්මේ සඳහන් ලොට් 2, මුළු ඉඩමෙන් වෙන් කර ඇති අඩි 12ක් පළල පොදු පාර සහ සලීම්ගේ උරුමක්කරුවන්ට හිමි අංක එස්එන්/01/4722 සැලැස්මේ සඳහන් ලොට් 23 ද යන මායිම් තුළ පර්චස් විස්සක් (අ.0, රූ. 0, පර්. 20)ක් නොහොත් හෙක්ටයාර 0.0606ක් විශාල එහි පිහිටි සියලු අයිතීන් සමග ඉඩම.

### හතරවෙනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කත්තන්කුඩි ඩී. එස්. කොට්ඨාසයේ, කත්තන්කුඩි නගර සභා සීමාව තුළ වරිපනම් අංක 170 දරන නිව් බීච් රෝඩ් හි කත්තන්කුඩි කොට්ඨාසය-6ජීඑන් කොට්ඨාසය, කත්තන්කුඩි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. නාගලිංගම් විසින් සාදන ලද 1998.02.26 දිනැති අංක එස්එන්/98/3717 සැලැස්මේ සඳහන් අලෙයියනෝදෙයි වලවු මක්කඩ්ඩියන් ඕඩෙයි, වලවු පලක්කෙයි වෙඩ්ඩෙයි මක්කඩ්ඩියන් ඕඩෙයි වලවු නමැති ඉඩමෙ ලොට් අංක 6 සහ ලොට් අංක 5හි උතුරු භාග කොටස ලෙස නිරූපනය වන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට පරිමාණය උතුරේ සිට දකුණට : අඩි 42ක් ද, නැගෙනහිර සිට බස්නාහිරට : උතුරට අඩි 142ක් ද, දකුණට : අඩි 153ක් ද වේ. මෙය නැවත මැන බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ඒ. සිංගරාජා විසින් සාදන ලද 2013.07.25 දිනැති අංක ඒඑස්/2013/150ඒ මිනුම් සැලැස්මේ සවිස්තරව විස්තර කර ඇති ලොට් 1 ලෙස නිරූපනය වන ඉඩම් කොටසට මායිම්, නැගෙනහිරට : නිව් බීච් රෝඩ් ද, බස්නාහිරට : එම්. අයි. එම්. කාසිම්ට හිමි ඉඩම ද, උතුරට මුළු ඉඩමෙන් වෙන්කර ඇති අඩි 8ක් පළල පාර ද, දකුණට : එම්. අයි. එම්. කාසිම්ට හිමි ඉතිරි කොටසද යන මායිම් තුළ පර්චස් විසි දෙකයි දශම හතයි හතරක් (අ.0, රූ. 0, පර්. 22.74)ක් නොහොත් හෙක්ටයාර 0.0575ක් විශාල එහි පිහිටි සියලු අයිතීන් සමග ඉඩම.

### පස්වෙනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කත්තන්කුඩි ජීඑස් කොට්ඨාසයේ, කත්තන්කුඩි නගර සභා සීමාව තුළ වරිපනම් අංක 7 දරන කත්තන්කුඩි කොට්ඨාසය ජී6 දැන් වෝඩ් 6 රාසා අලිම් රෝඩ් ගම පිහිටි පනයියඩි තෝන කන්ඩම් නමැති ඉඩමේ බෙදා වෙන්කරන ලද බස්නාහිර පංගුව පරිමාණයෙන් උතුරේ සිට දකුණට බඹ 6ක් ද, නැගෙනහිර සිට බස්නාහිරට : උතුරු පැත්තෙන් බඹ 8ක් ද, දකුණු පැත්තෙන් බඹ 7 1/2ක් ද වේ. මෙය නැවත මැන බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ඒ. සිංගරාජා විසින් සාදන ලද 2013.07.25 දිනැති අංක ඒඑස්/2013/150බී මිනුම් සැලැස්මේ ලොට් 1 නිරූපනය කර සවිස්තරව විස්තර කර ඇති අතර එයට මායිම්, නැගෙනහිරට : සාහුල් හමීඩ් ජොහාරා උම්මා ගේ වත්ත ද, බස්නාහිරට : පාර ද, උතුරට : පරූක්ට හිමි ඉඩම සහ දකුණට : අඩි 3 1/2ක් පළල පටු මඟ ද යන මායිම් තුළ පර්චස් හයයි දශම හතරයි හතරක් (අ.0, රූ. 0, පර්. 06.44)ක් නොහොත් හෙක්ටයාර 0.0163ක් විශාල ගොඩනැගිල්ල සහ එහි තුළ අඩංගු සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මෙය,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

09 - 444/2

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එච්. ටී. එන්. ඩී. පීරිස්.
ගිණුම් අංක : 0095 5000 3365.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. සුබසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 2014.03.19 දාතම හා අංක 1589 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හේවා තන්තිරිගේ නිහාල් ධම්මික පීරිස් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1589 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් අනූ එක් ලක්ෂ හැට අට දහස් හාරසිය පනස් හයයි ශත පහක (රු. 91,68,456.05) මුදලක් 2015 මාර්තු මස 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් අනූ එක් ලක්ෂ හැට අට දහස් හාරසිය පනස් හයයි ශත පහක (රු. 91,68,456.05) මුදලද, 2015 මාර්තු මස 19 වැනි දින සිට අංක 1589 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය කෙත්, රුපියල් අසූ දෙලක්ෂ හැට හය දහස් හත්සිය විසි තුනයි ශත අසූවක (රු. 82,66,723.80) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1589 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුකහ බටහිර කොරළේ දඹදෙනි හත්පත්තුවේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අතුරුවල අංක 1038 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අතුරුවල සහ දෙලිකණුව ග්‍රාමවල පිහිටි "අතුරුවල වතුයාය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ඩබ්ලිව්. අයි. ජයසේකර යන අය විසින් සාදන ලද 2011 ජුනි මස 23 දාතම හා අංක 502/2011 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : බලයලත් මානක තැන එස්. බී. අබේකෝන් යන අය විසින් සාදන ලද 1987 අගෝස්තු මස 05 දාතම හා අංක 1129 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 (අඩි 15 පළල පාර සඳහා වෙන්කිරීම), ගිණිකොනට : අංක 1129 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 5 (දයානන්ද වීරසිංහ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම), නිරිතට : අංක 1129 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 12 සහ අංක 1129 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 13 (සමන් තෙන්නකෝන් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම) සහ වයඹට : අංක 1129 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 3 (නිමල් ජයරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0. රූ. 1. පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග එකී අංක 502/2011 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී අතුරුවල ග්‍රාමයේ පිහිටි "අතුරුවල වතුයාය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. බී. අබේකෝන් යන අය විසින් සාදන ලද 1987 අගෝස්තු මස 15 දාතම හා අංක 1129 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ලොට් 1 (පාර), ගිණිකොනට : මෙහි ලොට් 5, නිරිතට : මෙහි ලොට් 12 සහ 13 සහ වයඹට : මෙහි ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග එකී අංක 1129 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව T 34/60 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

09 - 454

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කල්මුණේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

අරුණාසලාම් ලවකුමාර් සහ අර්සරත්නම් සස්මිතා

2015 ජුලි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. පෙරින්පරාජා විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද, 2006 මාර්තු මස 02 වැනි දින සහතික කළ අංක 429, 2007 සැප්තැම්බර් මස 21 වැනි දින සහතික කළ අංක 522, 2009 මාර්තු මස 21 වැනි දින සහතික කළ අංක 570 සහ 2011 මැයි 23 වැනි දින සහතික කළ අංක 824 සහ කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. ආර්. හාති විසින් 2014 මාර්තු මස 28 වැනි දින සහතික කළ අංක 1110 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරුණාසලාම්

ලවකුමාර් සහ අර්සරත්නම් සස්මිතා ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් අනූහතර ලක්ෂ අනූහතර දහස් හත්සිය දහනමයයි ශත හතළිස් පහ (රු. 94,94,719.45) ක මුදලක් 2015 මැයි මස 14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී (රු. 94,94,719.45)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 429, 522, 570, 824 සහ 1110 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිවකුපත්තුවේ කල්මුණේ 01 පිහිටි "මන්කාලන්කේරනි" නැමති ඉඩමේ මැද කොටසේ සිට දකුණට : නැගෙනහිර කොටසේ විශාල ප්‍රමාණයක් වන 3 වන ඒකකයේ ඉඩම් කොටස, උතුරට : සෙල්ලයියා කිරුපයිරාජාට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : අඩි 3ක පටුමගෙන් ද, දකුණට : එම්. එච්. සුබායිතා උම්මා සහ සුබුරුල්ලාට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : අඩි 10ක් පළල පටුමගෙන් ද, මායිම් වූ උතුර සිට ගිණිකොන දෙසට අඩි 55ක් ද, බටහිරට දෙසට අඩි 65ක් ද, නැගෙනහිර සිට බටහිරට අඩි 96ක් ද විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග එහි පිහිටි අනෙකුත් සියලුදේත් සමග වන මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව කේ 151/209 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස බලයලත් මිනින්දෝ ඒ. සිංගරාජා විසින් 2003 මැයි මස 25 වැනි දින පිළියෙල කළ අංක ඒඑස්/2003/440 දරන මෑත කාලීන පිඹුර අනුව පහත පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කල්මුණේ මහනගර සභා සීමාව තුළ කරෙයිවකුපත්තුවේ කල්මුණේ 01හි ගබඩා පාරේ අංක 45/2ඒ දරන ස්ථානයේ හි පිහිටි "මන්කාලම් කේරණි" නමැති ඉඩම කොටසට මායිම් වශයෙන් උතුරට : සී. කිරුපයිරාජා හිමිකම් කියන ගෙවත්තෙන් ද, නැගෙනහිරට : කේ. තේවරාජා හිමිකම් කියන ගෙවත්තෙන් ද, දකුණට : පී. රාජකුමාරි හිමිකම් කියන ගෙවත්තෙන් ද සහ බස්නාහිරට : පුද්ගලික පටුමගෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම අටයි හතරක (අ. 0, රූ. 0, පර්. 20.84) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග එහි පිහිටි අනෙකුත් සියලුදේත් සමග වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09 - 466/1

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කල්මුණේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

අරුණාසලාම් ලවාකුමාර් සහ සෙල්වනායකි අරුණාසලාම්

2015 ජුලි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් රාජරත්නම් ගයත්‍රි විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද, 2014 සැප්තැම්බර් මස 02 වැනි දින සහතික කළ අංක 689 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරුණාසලාම් ලවාකුමාර් සහ සෙල්වනායකි අරුණාසලාම් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස් හත්ලක්ෂ අසූ දහස් තුන්සිය හතළිස් අටයි ශත දාහත (රු. 57,80,348.17) ක මුදලක් 2015 මැයි මස 21 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද, එකී (රු. 57,80,348.17)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 689 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිවකුපත්තුවේ කල්මුණේ ගමේ කොට්ඨාස 01හි පිහිටි කල්මුණේ වලව් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. විස්වලිංගම් විසින් 1960 සැප්තැම්බර් මස 27 වැනි දින මැන සාදන ලද අංක 19/60 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 13 දරන කොටසේ බස්නාහිර කොටසට මායිම් වශයෙන්, උතුරට : ගබඩා පාරෙන් ද, නැගෙනහිරට : පී. රාසනායගම්ගේ ඉඩමෙන් ද, දකුණට : තුරෙයිරාසා සහ බිරිඳගේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : ටී. රාසරේතිනම්ගේ ඉඩමෙන් ද, මායිම් වූ උතුර සිට දකුණ දෙසට අඩි 110ක් ද, සහ නැගෙනහිරට සිට බටහිරට : අඩි 35ත් ද, විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග නිවාස සහ එහි පිහිටි අනෙකුත් සියලුදේත් සමග වන මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව බි 11/125 යටතේ ලියාපදිංචි කර ඇත.

මැතකදී සාදන ලද පිඹුරක මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, (කරේයිවකුපත්තුවේ) කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්මුණේ මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 01ඒ ග්‍රාම නිලධාරී වසමේ කල්මුණේ ගමේ හි ගබඩා පාරේ පිහිටි වරිපනම් අංක 102 දරන ට්පි 49223 නැමති ඉඩමට මායිම් වශයෙන් උතුරට : ගබඩා පාර ද, නැගෙනහිරට : පී. රාසනායගම්ගේ ඉඩමෙන් ද, දකුණට : තුරෙයිරාසා සහ බිරිඳගේ ඉඩමෙන් ද, බස්නාහිරට : ටී. රාසරේතිනම්ගේ ඉඩමෙන්ද මායිම් වූ පර්චස් දාහතරයි දශම අටයි දෙක (අ. 0, රූ. 0, පර්. 14.82)ක හෝ හෙක්ටයාර් 0.037484ක විශාලත්වයෙන් යුක්ත ඉඩම සහ එහි ඇති ස්ථිර ගොඩනැගිලි සහ සියලුම දේත් සමග වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09 - 466/2

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කරෙයිතිව් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

අබ්දුල් මජීඩ් මොහොමඩ් තස්ලීම් සහ අබ්දුල් මජීඩ් මොහොමඩ් හෆ්රාත්

2015 ජූලි මස 30 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

නින්තවූර් ප්‍රසිද්ධ නොතාරිස් අල්හජ් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2012 පෙබරවාරි මස 09 වැනි දින සහතික කළ අංක 7531 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් මජීඩ් මොහොමඩ් තස්ලීම් සහ අබ්දුල් මජීඩ් මොහොමඩ් හෆ්රාත් යන අය ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 මැයි මස 10 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් පනස් නමලක්ෂ හැත්තෑ හත්දහස් තුන්සිය දාහතරයි ශත අසූ එකක (රු. 59,77,314.81) මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද,

නින්තවූර් ප්‍රසිද්ධ නොතාරිස් අල්හජ් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2012 ජූලි මස 23 වැනි දින සහතික කරන ලද අංක 7674, 2011 සැප්තැම්බර් මස 23 වැනි දින සහතික කරන ලද 7382 සහ 2012 නොවැම්බර් මස 29 වැනි දින සහතික කරන ලද අංක 7771, දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් මජීඩ් මොහොමඩ් තස්ලීම් සහ අබ්දුල් මජීඩ් මොහොමඩ් හෆ්රාත් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ 2015 මැයි මස 10 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් අනූ ලක්ෂ හතළිස් දහස් හාරසීය අනූ තුනයි ශත හැත්තෑවක (රු. 90,40,493.70) මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද,

එකී හිඟ මුදල්වල එකතු වන රු. 1,50,17,808.51ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 11 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලියද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 7531, 7674, 7382 සහ 7771 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත පළවන, දෙවන සහ තුන්වන උපලේඛනයන් හි සවිස්තරව විස්තර කොට ඇත්තාවූද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමු වැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරේයිවාහු පත්තුවේ මාලිගායික්කාඩු බටහිර පිහිටි "කොඩෙයිපත්තු වලව්" නැමති ඉඩම විශාලත්වයෙන් උතුරේ සිට දකුණට : බඹ 8කින් සහ නැගෙනහිර සිට බටහිරට : බඹ 16 1/2කින් සමන්විත වේ. මෙම ඉඩම බෙදා වෙන් කරන ලද වෙනත් ප්‍රමාණයෙන් නිරිතදිග කෝණයේ සිට උතුරට සහ උතුරේ සිට දකුණට : අඩි 10ක් ද, නැගෙනහිර සිට බටහිරට : අඩි 23ක් ද වේ. ඉතුරු ඉඩම් ප්‍රමාණය උතුරේ සිට දකුණට නැගෙනහිර දෙසට බඹ 8ක් ද, උතුරු අන්තයේ සිට බටහිර දෙසට බඹ 16 1/2 ක්ද, නැගෙනහිර දෙසට බඹ 8ක්ද, උතුරු අන්තයේ සිට වේ. මෙම අන්තයේ සිට දකුණු දෙසට බඹ 5 1/2ක්ද මෙහි සිට නැගෙනහිට අඩි 23ක් ද, මෙම අන්තයේ සිට දකුණු දෙසට අඩි 10ක් වේ. මෙම අන්තයේ සිට බටහිර දෙසට අඩි 23ක් ද මෙම අන්තයේ සිට දකුණු දෙසට 2අඩි 10ක්ද, මෙම අන්තයේ සිට බටහිර දෙසට අඩි 23ක් ද වේ. මේ අන්තයේ සිට දකුණු දෙසට අඩි 5ක් ද මෙම අන්තයේ සිට නැගෙනහිර දෙසට අඩි 16 1/2 ක්ද වේ. උතුරට : යූ. එල්. අබ්දුල් මජීඩ් සහ ඒ. එම්. සිත්ති නහිලා සහ ස්වාමිපුරුෂයාටද අයිති ඉඩම ද, නැගෙනහිරට : කුලන්තායිඋම්මාට අයිති ඉඩම ද, දකුණට : ආදම් බාවා සහ ඒ. එම්. සිත්ති නහිලා සහ ස්වාමිපුරුෂයාට ද අයිති ඉඩම සහ බටහිරට : ප්‍රධාන පාර සහ ඒ. එම්. සිත්ති නහිලා සහ ස්වාමිපුරුෂයාට අයිති ඉඩම ද මගින් මායිම් වූ ඉඩමද නිවස ළිඳ සහ පොල් වගාව හා වෙනත් එහි ඇතුලත් සියළුදේත් සමග වේ.

වී. ආර්. රාජේන්ද්‍රන් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක ආර්/644/2010 හා 2010/12/08 දිනැති මැතකදී මැන සාදන ලද පිඹුර ප්‍රකාරව පහත පරිදි විස්තර කර ඇත.

ශ්‍රී ලංකා සමුහාණ්ඩුවේ, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරයිතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිගායිකාඩුවේ පිහිටි කරෙයිතිව් ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රධාන පාරේ කොඩ්ඩෙයිපත්තු වලව් නැමති ඉඩම් කොටසට මායිම්, උතුරට : අබ්දුල් මජීඩ් මොහොමඩ් හෆ්රාත්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : කුලෙන්තායි උම්මාට අයිති ඉඩම ද, දකුණට : ඒ. එල්. ආදම්බාවා සහ ඒ. එම්. සිත්ති නහිලා සහ ස්වාමිපුරුෂයාට අයත් ඉඩමද, බටහිරට : ප්‍රධාන පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ඒ. එම්. සිත්ති නහිලා සහ ස්වාමි පුරුෂයාට අයිති කියන ගොඩනැගිල්ලද වේ. ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0177 (අ. 0, රූ. 0, පර්. 7.00).

### දෙ වැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරෙයිවාහු පත්තුවේ මාලිගායිකාඩු බටහිර කරේයිතිව් හි පිහිටි වේලියාදි "එලවිස්සම්" නැමති බෙදා වෙන්කළ ඉඩම් කොටසට විශාලත්වයෙන් උතුරේ සිට දකුණට : අඩි 41ක් ද, නැගෙනහිර සිට බටහිරට : අඩි 30ක් ද වේ. මෙයින් බෙදා වෙන් කළ උතුරු කොටස විශාලත්වයෙන් උතුරේ සිට දකුණට : අඩි 31 ද, නැගෙනහිර සිට බටහිරට : අඩි 30ක් ද වේ. උතුරට : සෙයනිලාබ්ඩීන් මොහොමඩ් රිෆායිගේ ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : ඒ. එම්. අබ්දුල් රසාක්ගේ ඉඩම ද සහ බටහිරට : ඒ. ආර්. අබ්දුල් රසාක්ගේ ඉඩම මගින් මායිම් වන ඉඩම සහ එහි ඇති සියළුදේත් සමග වේ.

මැතකදී අවසරලත් මිනින්දෝරු වී. රාජේන්ද්‍රන් මහතා විසින් 2011.09.10 වැනි දින මැන සාදන ලද අංක ආර්/237/2011 දරන පිඹුරේ ඉහත කී ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

ශ්‍රී ලංකා සමූහාණ්ඩුවේ නැගෙනහිර පළාතේ මාලිගායිකඩු ගමේ පිහිටි කාරේයිතිව් ප්‍රාදේශීය සභා සීමාව තුළ වේලියාඩි එලවිසම් නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : සෙයිනුලාබ්දීන් මොහොමඩ් රීෆායිට අයත් ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, (මා.ස.අ) දකුණට : ඒ. ආර්. අබ්දුල් රසාක්ට අයිති ඉඩම ද සහ බස්නාහිරට : ඒ. ආර්. අබ්දුල් රසාක්ට අයිති ඉඩම ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0086 (අ. 0, රූ. 0, පර්. 3.42) වේ.

### තුන් වැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරෙයිවාහු පත්තුවේ, කරේයිතිව් මාලිගායිකාඩු බටහිර පිහිටි බෙදා වෙන්කළ ඉඩම වේ. මෙයින් බෙදා වෙන්කළ උතුරු කොටස විශාලත්වයෙන් උතුරේ සිට දකුණු බටහිර දෙසට අඩි 13කින් ද, උතුරු අන්තයේ සිට නැගෙනහිරට දෙසට අඩි 94කින් ද. මෙම අන්තයේ සිට අඩි 28 1/2 න්ද, මෙම අන්තයේ සිට බටහිර දෙසට අඩි 42න් ද, මෙම අන්තයේ සිට උතුරු දෙසට අඩි 15 1/2කින් ද, මෙම අන්තයේ සිට බටහිර දෙසට අඩි 52 කින් ද සමන්විත වූ, උතුරට : යූ. එල්. අබ්දුල් මජීඩ් සහ තවත් අයට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : කුලන්තායිඋම්මගේ ඉඩමෙන් ද, දකුණට : පටුමග සහ ඒ. එම්. මොහොමඩ් තස්ලීම්ට අයිති ඉඩමෙන් ද, ඉතුරු ඉඩමෙන් ද සහ බටහිරට : අඩි 3ක් පළල පටුමග ද සහ ප්‍රධාන පාර ද මතින් මායිම් වූ ඉඩම සහ එහි ඇති සියළු දේත් සමග වේ.

කේ. තව්වානමූර්ති බලයලත් මිනින්දෝරු තැනගේ අංක කේටි/72/2012 හා 2012/11/01 දින දරන මෑතකදී මැන සාදන ලද පිඹුර අනුව එහි ඉඩම පහත සඳහන් පරිදි විස්තර වේ.

ශ්‍රී ලංකාවේ සමූහාණ්ඩුවේ, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරේයිතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිගායිකාඩු වේ කරේයිතිව් ප්‍රාදේශීය සභා බලසීමාව තුළ පිහිටි ප්‍රධාන පාරේ ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : අබ්දුල් මජීඩ්, මොහොමඩ් තස්ලිම් ෂර්මිලාට අයිති ඉඩම ද, දකුණට : අබ්දුල් මොහොමඩ් තස්ලිම්ට අයිති ඉඩම සහ ගොඩනැගිල්ල ද සහ බටහිරට : පාර ද (මා.ස.අ.) ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0165 (අ. 0, රූ. 0, පර්. 06.51) වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09 - 466/3

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - චන්කනෙයි ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

පොන්නතුරෙයි සූරියකුමාර් සහ වසන්තා සූරියකුමාර්

2015 ජූලි මස 30 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එම්. ත්‍යාගරාජා විසින් 2011 ජූලි මස 27 වැනි දින සහතික කළ අංක 13437, යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසර්මා විසින් 2013 නොවැම්බර් මස 15 වැනි දින සහතික කළ අංක 248 සහ 2014 මාර්තු මස 11 වැනි දින සහතික කළ අංක 338, යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එම්. ත්‍යාගරාජා විසින් 2012 පෙබරවාරි මස 10 වැනි දින සහතික කළ අංක 14013 සහ යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසර්මා විසින් 2014 පෙබරවාරි මස 03 වැනි දින සහතික කළ අංක 304 දරන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොන්නතුරෙයි සූරියකුමාර් සහ වසන්තා සූරියකුමාර් යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි අනූ එක් ලක්ෂ අනූපන්දහස් නමසිය දෙකයි ශත අසූ එක (රු. 1,91,95,902.81) ක මුදලක් 2015 මාර්තු මස 04 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 1,91,95,902.81ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මාර්තු මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 13437, 248, 338, 14013 සහ 304 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පළවන හා දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූද, දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමු වැනි උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙන්මරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, චාවකච්චේරි ප්‍රාදේශීය සභා සීමාව තුළ කයිතඩි බටහිර (ජේ/293) ග්‍රාම නිලධාරි වසමේ නාවට්කුලි පත්තුවේ, කයිතඩි හි මානිපේ පාරේ පිහිටි "අම්බලවානන් කාලඩ්ඩි වායල් එඩ්ඩුවරක්කලඩ්ඩි, උයරාම් අම්බලවානන් කාලඩ්ඩි, අම්බලවානන් කාලඩ්ඩි පුලම් මරුතොන්රි අම්බලවානන් කාලඩ්ඩි වායල් සහ පුලම්" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පන්චට්චරම් විසින් 2005 සැප්තැම්බර් මස 17 වැනි දින මැන සාදන ලද අංක 344 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 දරන ලාච්චමාස් වරගු කල්චර් 15 (15 එල්එම්එස් වී.සී) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම් කොටසට එකී පිඹුර ප්‍රකාරව මායිම් වශයෙන්, නැගෙනහිරට : සින්නතම්බි වේලායුදර්ගේ දේපළ ද, උතුරට : ඩැනියල් සිතාසිවම් සහ තවත් අයට අයිති දේපළ ද, බස්නාහිරට : රජයේ ඉඩම සහ දකුණට : පාරෙන් ද, මායිම් වූ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේත් සමග වන අතර මෙය යාපනය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එෆ් 781/19යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් දේ ඇතුලුව ස්ථාවර යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම් සියල්ල සමග වේ.

1. ෆීඩිං බකට්, කොන්වේ බෙල්ට් සහ මෝටරය සමග ගල්කඩන යන්ත්‍රය.
2. ඩීසල් එන්ජිම සහ මෝටරය සමග කල්කඩන යන්ත්‍රය.
3. ගල්කඩන යන්ත්‍රය.
4. සීව්ස් 2යි.
5. ලෝඩරය.

### දෙවැනි උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙන්මරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, චාවකච්චේරි ප්‍රාදේශීය සභා සීමාව තුළ කයිතඩි බටහිර (ජේ/293) ග්‍රාම නිලධාරි වසමේ නාවට්කුලි පත්තුවේ, කයිතඩි හි මානිපේ

පාරේ පිහිටි වරිපනම් අංක 118 දරන ස්ථානයේ පිහිටි අම්බලවානන් කාලඩ්ඩි තලෛයිමඩෙයි වායල් එඩ්ඩුවරක්කලඩ්ඩි සහ "වෙනත් කොටස්" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් 2011 සැප්තැම්බර් මස 12 වැනි දින සාදන ලද අංක 1217 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 දරන ලාච්චමස් වරගු කල්වර් දහතුනක් සහ කුලිස් දහයයි දශම එකයි හතරක (13 එල්එම්එස් වී.සී සහ 10.14 කේඑල්එස්) විශාලත්වයෙන් යුතු ඉඩම් කොටසට එකී පිඹුර ප්‍රකාරව මායිම් වශයෙන්, නැගෙනහිරට : අරියකුඩ්ඩි සහ බිරිඳ සුගිර්දම් සහ සින්ප්පොඩි කන්දය්යාගේ දේපළ ද, උතුරට : තාමෝදරම්පිල්ලේ සහ බිරිඳ නිලච්චිපිල්ලේගේ දේපළ ද, බස්නාහිරට : පොන්නුදුරේ සූරියකුමාර්ගේ දේපළ ද සහ දකුණට : පාරෙන් ද මායිම් වූ දේපළ සහ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ සියලුම දේත් සමග වන අතර මෙය යාපනය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව එෆ් 823/74 යටතේ ලියාපදිංචි කර ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),<br>
මාණ්ඩලික ලේකම්.

09 - 466/4

---

## හැටන් නැෂනල් බැංක් පීඑල්සී - කල්මුණේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

සයිඩ් ඉබ්‍රාහිම් අන්වර්

2015 ජූලි මස 30 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

නින්තවූර් ප්‍රසිද්ධ නොතාරිස් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2012 මාර්තු මස 12 වැනි දින සහතික කළ අංක 7569 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සයිඩ් ඉබ්‍රාහිම් අන්වර් යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 අප්‍රේල් මස 21 වැනි දිනට හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත රුපියල් අසූ ලක්ෂ අනූ දහස් හයසිය අනූ තුනයි ශත හතරක (රු. 80,90,693.04) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද,

නින්තවූර් ප්‍රසිද්ධ නොතාරිස් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2012 මාර්තු මස 12 වැනි දින සහතික කරන ලද අංක 7569 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සයිඩ් ඉබ්‍රාහිම් අන්වර් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 අප්‍රේල් මස 21 වැනි දිනට හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත රුපියල් දෙකෝටි හතළිස් අටලක්ෂ හය දහස් නමසිය පනස් හයයි ශත හැත්තෑ දෙකක (රු. 2,48,06,956.72) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද,

එකී හිඟ මුදල් වල එකතුව වන රු. 3,28,97,649.76)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අප්‍රේල් මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 7569 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

ඔප්පු අංක 13865

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරපත්තුවේ, අඩ්ඩාලයිචෙනයිහි පිහිටි රෝඩාඩිකන්දම්-පොල්වත්ත නැමති වෙනත් කන්දම් සමග ඒකාබද්ධ කර බෙදා වෙන් කරන ලද අංක ටි.පි. 51 දරන පිඹුරේ ලොට් අංක 951 දරන ඉඩම් කෙටසේ බෙදා වෙන් කරන ලද උතුරු අර්ධ කොටසට මායිම් වශයෙන්, උතුරට : ජලීල්ගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. එල්. මොහොමඩ් ස්මයිල්ගේ ඉඩමෙන් ද, දකුණට : ඒ. එල්. සුහයිබ් සහ තවත් අයට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : ප්‍රධාන පාරෙන් ද මායිම් වූ උතුරේ සිට දකුණට අඩි 40 1/2ක් ද නැගෙනහිර සිට බස්නාහිරට අඩි 192ක් ද විශාලත්වයෙන් ඇති බිම් කොටස සහ එහි ඇති සියලුම දේත් සමග වන අතර මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු එම් 245/32 යටතේ ලියාපදිංචි කර ඇත.

ඔප්පු අංක 3614

ලොට් 1

ඉහත සඳහන් ඉඩමෙන් බෙදූ නැගෙනහිර කොටස උතුරේ සිට දකුණට : බඹ 14ක් ද, නැගෙනහිර සිට බටහිරට : බඹ 15ක් ද, විශාලත්වයෙන් යුක්ත වේ. උතුරට : අයි. නයිමාගේ ඉඩම ද, නැගෙනහිරට : සියානා තව්ෆීක් මහත්මියගේ ඉඩම ද, දකුණට : එස්. ඒ. ජාසාර්ගේ ඉඩම ද සහ බස්නාහිරට : ඒ. එල්. ෆයිරූස්ගේ ඉඩම ද වශයෙන් මායිම් වේ. මෙයින් බෙදූ බස්නාහිර කොටසේ විශාලත්වය උතුරේ සිට දකුණට අඩි 84ක් ද සහ නැගෙනහිර සිට බස්නාහිරට අඩි 56ක් ද, දකුණු දෙසට අඩි 57ක් ද වේ.

ලොට් 2

ඉහත සඳහන් ඉඩමේ ඒකාබද්ධ කොට බෙදා වෙන් කරන ලද නිරිතදිග කෙරවල උතුරට : ඒ. එල්. ෆයිරූස්ගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් 1න් ද, දකුණට : විකුණුම්කරුගේම තවත් ඉඩමක් ද සහ බස්නාහිරට : මාර්ගයෙන් ද මායිම් වූ උතුරේ සිට දකුණට : බඹ 02ක් ද, නැගෙනහිර සිට බස්නාහිරට : බඹ 17ක් ද විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සහ එහි ඇති සියලුම දේත් සමග වේ.

ඉහත කී ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු එස්. ඒ. මොහොමඩ් තස්ලීම් විසින් 2011 ඔක්තෝබර් මස 10 වැනි දින මැන සාදන ලද අංක ටි/1434/ඒ දරන මෑත කාලීන පිඹුර අනුව පහත පරිදි විස්තර වේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අඩ්ඩාලයිචෙනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩ්ඩාලයිචෙනයි ප්‍රාදේශීය සභා සීමාව තුළ අඩ්ඩාලයිචෙනයි හි පිහිටි අඩ්ඩාලයිචෙනයි 14 නැමති ගම පිහිටි ඉඩමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. නූර්දීන් විසින් 2006 මාර්තු මස 31 වැනි දින ලියා සහතික කරන ලද ඔප්පු අංක 13865 සහ නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. කසුර්දීන් විසින් 2011 මාර්තු මස 02 වැනි දින ලියා සහතික කරන ලද ඔප්පු අංක 3614 දරන ඔප්පු වල අංක 1 සහ 2 උපලේඛනවල සඳහන් දේපළ වල මැනීමක් සහ විස්තරයක් කරන්නාවූ ලොට් 1 වශයෙන් මායිම් දරන ඉඩම් කොටසට, උතුරට : ඒ. එල්. ෆයිරූස්,

අයි නයිමා සහ සියානා තව්ෆීක්ගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : සියානා තව්ෆීක්, ඒ. එල්. ස්මයිල් සහ තවත් අයට අයිති ඉඩමෙන් ද, දකුණට : ඒ. එල්. සුබයිබ් සහ තවත් අයට අයිති ඉඩමෙන් ද, බස්නාහිරට : ප්‍රධාන පාරෙන් ද මායිම් වූ (අ. 0, රූ. 01, පර්. 08) හෙක්ටයාර් 0.124ක් විශාලත්වයෙන් වූ ඉඩම වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

09 - 466/5

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ත්‍රිකුණාමලය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

විග්නේස්වරරාජා ප්‍රගාෂ්

2015 ජූලි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් ටී. තුශ්‍යන්තන් විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2014 ජනවාරි මස 30 වැනි දින සහතික කළ අංක 2657 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විග්නේස්වරරාජා ප්‍රගාෂ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි විසිඑක්ලක්ෂ අනූතුන් දහස් එකසිය තිස්හතරයි ශත හැත්තෑ දෙක (රු. 1,21,93,134.72) ක මුදලක් 2015 ජූනි මස 08 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී (රු. 1,21,93,134.72)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජූනි මස 09 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ට තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 2657 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත පළවන, දෙවැනි සහ තුන්වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### පළවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සභා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමලය නගර සභා සීමාව තුළ 244එල් පෙරුන්තේරු ග්‍රාම නිළධාරි වසමේ කොට්ඨාස අංක 7හි පිහිටි නගර සභා අංක 08 බසාර් කොටසේ ත්‍රිකුණාමලය එහම්පරම් පාරේ වරිපනම් අංක 107 දරන ඉඩමට ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින මැන සාදන ලද අංක 52 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කැබැල්ල තුළ ඇති ගොඩනැගිලි සහ ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරේ ලොට් ඊ වශයෙන් දැක්වෙන පටුමග පරිහරණය කිරීමේ අයිතිය සහ අනෙකුත් සියලු අයිතිවාසිකම් සමග වන අතර ඉහත සඳහන් ලොට් ඒ දරන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එහම්පරම් පාර ද, නැගෙනිහිරට : ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරේ ලොට් බී ද, දකුණට : පටුමග ද සහ බස්නාහිරට : ත්‍රිකුණාමලය මුත්තුකුමාරස්සාමි කෝවිලට අයත් දේපළ ද, මායිම් වූ පර්චස් දෙකයි දශම තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 02.30) විශාලත්වයෙන් යුක්ත වන මෙය ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 32/72 යටතේ ලියාපදිංචි වී ඇත.

#### දෙවැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සභා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමලය නගර සභා සීමාව තුළ 244එල් පෙරුන්තේරු ග්‍රාම නිළධාරි වසමේ කොට්ඨාස අංක 7හි පිහිටි නගර සභා අංක 08 බසාර් කොටසේ ත්‍රිකුණාමලය එහම්පරම් පාරේ වරිපනම් අංක 107 දරන ඉඩමට ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින මැන සාදන ලද අංක 52 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් බී වශයෙන් දැක්වෙන ඉඩම් කැබැල්ල තුළ ඇති ගොඩනැගිලි සහ ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරේ ලොට් ඊ වශයෙන් දැක්වෙන පටුමග පරිහරණය කිරීමේ අයිතිය සහ අනෙකුත් සියලු අයිතිවාසිකම් සමග වන අතර ඉහත සඳහන් ලොට් බී දරන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එහම්පරම් පාර ද, නැගෙනහිරට : ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරේ ලොට් සී වශයෙන් දැක්වෙන වල්ලිපුරම් කන්දසාමිගේ බිරිඳ රත්නම්ට අයිති ඉඩම ද, දකුණට : පටුමග ද සහ බස්නාහිරට : ඉහත සඳහන් කළ අංක 52 දරන පිඹුරේ ලොට් ඒ වලින්ද මායිම් වූ පර්චස් තුනයි දශම තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 03.30) විශාලත්වයෙන් යුක්ත වන මෙය ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 32/73 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම් කට්ටි දෙක සහ පරිශ්‍ර ඒකාබද්ධ කොට මැන ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු ආර්. පොන්නුසාමි විසින් 1992 ජූලි මස 19 වැනි දින සාදන ලද අංක 1652 දරන පිඹුරේ ලොට් 1 දැනට නැගෙනිහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සභා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමලය නගර සභා සීමාව තුළ 244එල් පෙරුන්තේරු ග්‍රාම නිළධාරි වසමේ කොට්ඨාස අංක 7හි පිහිටි නගර සභා අංක 08 බසාර් කොටසේ ත්‍රිකුණාමලය එහම්පරම් පාරේ වරිපනම් අංක 105 සහ 107 වශයෙන් දැක්වෙන දේපළ සහ එහි ඇති ගොඩනැගිලි සහ ත්‍රිකුණාමලයේ බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින මැන සාදන ලද අංක 52 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් ඊ වශයෙන් දැක්වෙන පඩුමග පරිහරණ කිරීමේ අයිතිය සමග ඉඩමට මායිම් වශයෙන්, උතුරට : එහම්පරම් පාරේ වරිපනම් අංක 109 දරන මුත්තුකුමාරස්සාමි කෝවිලට අයත් දේපළ සහ එහම්පරම් පාර ද, නැගෙනහිරට : එහම්පරම් පාර සහ නැසීගිය එස්. ත්‍යාගරාජාගේ උරුමක්කරුවන් හිමිකම් කියන එහම්පරම් පාරේ වරිපනම් අංක 103 දරන දේපළ ද (1968 ජූනි මස 04 වැනි දින දරන පිඹුරු අංක 52හි ලොට් සී සහ ලොට් බී හි කොටසක්), දකුණට : එහම්පරම් පාරේ වරිපනම් අංක 103 දරන නැසීගිය එස්. ත්‍යාගරාජාගෙ උරුමක්කරුවන් හිමිකම් කියන දේපළ (1968 ජූනි මස 04 වැනි දින දරන පිඹුරු අංක 52 හි ලොට් සි සහ ලොට් බී) කොටසක් සහ අඩිපාර (බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින් 1968 ජූනි මස 04 වැනි දින සාදන ලද පිඹුරු අංක 52 හි ලොට් ඊ ද සහ බස්නාහිරට : අඩිපාර (බලයලත් මිනින්දෝරු එස්. වේළුපිල්ලේ විසින 1968 ජූනි මස 04 වැනි දින සාදන ලද පිඹුරු අංක 52හි ලොට් ඊ) සහ මුත්තුකුමාරස්සාමි කෝවිලට අයත් එහම්පරම් පාරේ වරිපනම් අංක 109 දරන දේපළ ද, මායිම් වූ පර්චස් හයයි දශම පහයි දෙක (අ. 0, රූ. 0, පර්. 06.52) විශාලත්වයෙන් යුක්ත වේ.

### ඉහත සඳහන් කල තුන්වන උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සහා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නගර සභා සීමාව තුළ 244එල් පෙරුන්තේරු ග්‍රාම නිලධාරි වසමේ කොට්ඨාස අංක 7හි පිහිටි නගර සභා අංක 08 බසාර් කොටසේ නැමති ඉඩමට ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේඑපිල්ලේ විසින් 1968 ජුනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති "ලොට් ඊ" වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේඑපිල්ලේ විසින් 1968 ජුනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරේ ලොට් ඒ, බී සහ සී ද, නැගෙනහිරට : ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු එස්. වේඑපිල්ලේ විසින් 1968 ජුනි මස 04 වැනි දින සාදන ලද අංක 52 දරන පිඹුරේ ලොට් ඩී ද, දකුණට : පටුමග ද සහ බස්නාහිරට : මුත්තුකුමාරස්වාමි කෝවිලට අයත් දේපළෙන් ද, මායිම් වූ පර්චස් බිංදුවයි බිංදුවයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0. පර්. 00.60) විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි සහ සියලුම දේත් සමග වන මෙය ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 32/299 යටතේ ලියාපදිංචි වී ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

09 - 466/6

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කල්මුණේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

මොහොමඩ් ඉබ්‍රාහාම් සියාරෝ සහ මොහොමඩ් අලීයාර් රවීයා උම්මා

2015 ජූලි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රකීබ් විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද 2014 මැයි මස 29 වැනි දින සහතික කළ අංක 1416, 1418 සහ 1420 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, මොහොමඩ් ඉබ්‍රාහාම් සියාරෝ සහ මොහොමඩ් අලීයාර් රවීයා උම්මා ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි හයලක්ෂ හතලිස් තුන්දහස් පන්සිය හැත්තෑහයයි ශත විසි නමය(රු.10,643,576.29) ක මුදලක් 2015 ජුනි මස 23 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී (රු.10,643,576.29) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජුනි මස 24 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 1416, 1418 සහ 1420 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත පළවන දෙවන සහ තුන්වන උපලේඛනයන් හි සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ පිහිටි ඉඩමෙන් බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසට මායිම් වශයෙන් උතුරට වී. නල්ලම්මාගේ ඉඩම ද, නැගෙනහිරට කේ. කරුවල්තම්බිගේ ඉඩම ද, දකුණට පාර සහ බස්නාහිරට වී. පුපතිගේ ඉඩම ද, විශාලත්වයෙන් උතුරේ සිට දකුණට බඹ දාහතක් (17) සහ නැගෙනහිර සිට බස්නාහිරට බඹ එකොළහකින් (11) යුක්ත ඉඩම සහ එහි ඇති සියලු දේ සමග වේ.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු අහමඩ් එම්. මහරූෆ් විසින් 2005 අගෝස්තු 26 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 264/05 හි පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්මුණේ මහනගර සභා සීමාව තුල කල්මුණේ 03 මාරියර් පාරේ පිහිටි වරිපනම් අංක 71 දරන ''කිලක්කුපුරපංගු වලව්'' නැමති ඉඩම් කට්ටියට මායිම් වශයෙන් උතුරට : වී. නල්ලම්මාගේ ඉඩම ද, නැගෙනහිරට : කේ. කරුවල්තම්බිගේ ඉඩම ද, දකුණට : මාරියාර් පාර ද සහ බස්නාහිරට : දැනට ඒ. රවියාඋම්මාගේ ඉඩමට ද, මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම තුනක (අ. 0, රූ. 0, පර්. 20.3) හෙවත් හෙක්ටයාර් 0.0514 ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමඟ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමඟ වන මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වී 17/19 යටතේ ලියාපදිංචි වී ඇත.

### ඉහත සඳහන් කළ දෙවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරෙයිවාහු පත්තුවේ, කල්මුණේ 03 මාරියාර් පාරේ පිහිටි වරිපනම් අංක 67 දරන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද බස්නාහිර කොටසට මායම් වශයෙන් උතුරට : කන්තප්පර් කරුවල්තම්බිගේ ඉඩම ද, නැගෙනහිරට : යූ. එල්. මොහොමඩ් ඉබ්‍රාහිම්ගේ ඉඩම ද, දකුණට : පාරද සහ බස්නාහිරට : ඉලයතම්බිගේ ඉඩම ද, විශාලත්වයෙන් උතුරේ සිට දකුණට බඹ දහතකින් (17) සහ නැගෙනහිර සිට බස්නාහිරට බඹ එකොළහකින් (11) සමන්විත ඉඩම එහි ඇති සියලු දේ සමඟ වේ.

ඉහත සඳහන් ඉඩම මෑතක දී කරන ලද මැනීමකින් පසු බලයලත් මිනින්දෝරු එස්. නේසරාජා විසින් 2014 අප්‍රේල් 05 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක එස්එන්ආර්/2014/1952 ට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිවාහුපත්තුවේ කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්මුණේ මහනගර සභා සීමාව තුල කල්මුණේ 02 මාරියර් පාරේ පිහිටි ඉඩම් කට්ටියට මායිම් වශයෙන් උතුරට : කරුවල්තම්බිගේ වත්ත ද, නැගෙනහිර : දැනට ඒ. රවියාඋම්මාගේ වත්ත ද, දකුණට: මරියාර් පාර ද සහ බස්නාහිරට : එළියතම්බිගේ වත්තට මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විසිහතරයි දශම හතයි තුනක් (අ.0, රූ. 0, පර්. 24.73) හෙවත් හෙක්ටයාර් 0.0625 විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමඟ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමඟ වන මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වී 18/48 යටතේ ලියාපදිංචි වී ඇත.

### ඉහත සඳහන් කළ තුන්වන උපලේඛනය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ 03 හි පිහිටි වරිපනම් අංක 452 දරන ඉඩමෙන් බෙද වෙන් කරන ලද අර්ධයට මායිම් වශයෙන් උතුරට : වී. සින්නතම්බිගේ ඉඩම ද, නැගෙනහිරට : එස්. කාලිඅම්මා සහ එම්. පොන්නම්මාට අයිති ඉඩම ද, දකුණට : පාර සහ බස්නාහිරට : එස්. කනප්පර සහ තවත් අයකුට අයිති ඉඩම විශාලත්වයෙන් උතුරේ සිට දකුණට බඹ දාහසයක් (16) සහ නැගෙනහිර සිට බස්නාහිරට බඹ එකොළහයි දශම පහකින් (11 1/2) සමන්විත ඉඩම සහ එහි ඇති සියලු දේ සමඟ වේ.

ඉහත සඳහන් ඉඩම මැතකදී කරන ලද මැනීමකින් පසු බලයලත් මිනින්දෝරු සී. පද්මනාදන් විසින් 2005 නොවැම්බර් 15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 388 හි පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්මුණේ මහනගර සභා සීමාව තුල කල්මුණේ 02 බවුන්ඩරි පාරේ පිහිටි වරිපනම් අංක 75 දරන ඉඩම් කට්ටියට මායිම් වශයෙන් උතුරට වී. සින්නතම්බිගේ වත්තද, නැගෙනහිරට එස්. කාලිඅම්මා සහ ඇම්. පොන්නම්මාට අයිති ඉඩමද, දකුණට බවුන්ඩරි පාරද, සහ බස්නාහිරට යූ. එම්. ඉබ්‍රහිම්ගේ වත්තෙන්ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දහඅටයි දශම දහහතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 18.48) හෙවත් හෙක්ටයාර් 0.046741 විශාලත්වයෙන් වූ ඉඩම සමඟ එහි පිහිටි අනෙකුත් සියලුදේත් සමඟ වන මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ වි 02/90 යටතේ ලියාපදිංචි වී ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09 - 466/7

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මඩකලපුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

මැකි නාසිසස් ෆැම්බෙක්

2015 ජූලි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. වී. ඉන්දන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2008 මාර්තු මස 17 වැනි දින සිට සහතික කළ අංක 14522, 2009 ඔක්තෝබර් 27 වැනි දින සහතික කළ අංක 15336, 2010 මැයි 08 වැනි දින සහතික කළ අංක 15650, සහ 2012 නොවැම්බර් මස 02 වැනි දින සහතික කළ අංක 17121 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම් මැකි නාසිසස් ෆැම්බෙක් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටලක්ෂ අනූඑක් දහස් හයසිය දහතයි ශත පහ (රු.6,091,617.05) ක මුදලක් 2015 අප්‍රේල් 07 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතු ඇති හෙයින්ද එකී රු. 6,091,617.05 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අප්‍රේල් මස 08 වැනිදින සිට දේපළ විකණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 14522, 15336, 15650 සහ 17121 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

*පළමුවන ඉඩම :*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ පත්තුවේ උරනි හි වරිපනම් අංක 20/5බී දරන කොට්ඨාස අංක 11 මඩකලපුව මහ නගර සභා සීමාව තුළ සෙල්වනායගම් පාරේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් 1999 සැප්තැම්බර් මස 05 වැනි දින සාදන ලද අංක AS//99/1379 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 03 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට එකී පිඹුරු අංක AS/99/1379 හි ලොට් අං 02 ද ගිණිකොණට එස්. මහීපාලන් හිමිකම් කියන වත්තෙන්ද වයඹට සෙල්වනායගම් පාරට පිවිසෙන පටුමගෙන්ද සහ නිරිතට එකී පිඹුරු අංක AS/99/1379 ලොට් අංක 04 න්ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාලත්වයෙන් වූ ඉඩම සහ ඊට අයත් සියලුම හිමිකම් සමඟ වන මෙය බී 548/259 යටතේ ලියාපදිංචි වී ඇත.

*දෙවන ඉඩම :*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, උතුරු මන්මුනේ පත්තුවේ, උරනි හි වරිපනම් අංක 20/5 සී, දරන කොට්ඨාස අංක 11 මඩකලපුව මහ නගර සභා සීමාව තුළ සෙල්වනායගම් පාරේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් 1999 සැප්තැම්බර් මස 05 වැනි දින මැන සාදන ලද අංක AS/99/1379 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 04 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට ඉහත කී පිඹුරු අංක AS/99/1379 හි ලොට් අංක 03 ද සහ නිරිතට එස්. පුවනේස්වරන් හිමිකම් කියන වත්තෙන්ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාලත්වයෙන් වූ ඉඩම සහ ඊට අයත් සියලුම හිමිකම් සමඟ වන මෙය බී 548/259 යටතේ ලියාපදිංචි වී ඇත.

දැනට මෙම ඉඩම් කට්ටි දෙක යාකොට එක් ඉඩමක් වශයෙන් බලයලත් මිනින්දෝරු එස්. ඇන්තනීපිල්ලේ විසින් 2006 පෙබරවාරි මස 15 වැනි දින සාදන ලද අංක SA/2111/2006 එම් එන් දරන පිඹුරේ ලොට් අංක 01 වශයෙන් දක්වා ඇති අතර එකී ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට පිඹුරු අංක AS/99/1379 හි ලොට් අංක 02 වශයෙන් දක්වෙන එස්. කනගරත්නම් මහත්මියට අයිති ඉඩමෙන්ද, වයඹට පටුමගෙන්ද, ගිණිකොණට එස්. පුවනේස්වරන් හිමිකම් කියන ඉඩමෙන්ද සහ නිරිතට සිවරත්නම්ට අයිති ඉඩමෙන්ද මායිම් වූ පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක විශාලත්වයෙන් වූ ඉඩම එහි ඇති ගොඩනැගිලි ළිඳ සහ අනෙකුත් සියලු දේත් සහ අයිතිවාසිකම් සමඟ වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-466/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.